සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

23 S I

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය ............................ දේශපාලන විද්‍යාව I කාලය පැය දෙකයි

- **මෙම ප්‍රශ්න පත්‍රය A - B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර, A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20 කින් යුක්ත වේ.**
- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු ප්‍රශ්න පත්‍රයේම සැපයිය යුතුයි.**
- **එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 100 කි.**

## A කොටස

- **අංක 1 සිට 15 දක්වා ප්‍රශ්න වල ප්‍රකාශ 4ක් නිවැරදිය. වැරදි (සාවද්‍ය) ප්‍රකාශය තෝරන්න.**

01. දේශපාලනය,
    1. සමාජ භාවිතය පිළිබඳ සිද්ධාන්තයකි.
    2. එය රාජ්‍ය හා ආණ්ඩුව පිළිබඳ අධ්‍යයනයකි.
    3. ගැටුම් කළමණාකරණය පිළිබඳ කරුණකි.
    4. පුරවැසි ක්‍රියා කාරිත්වයක් හා සහභාගිත්වයක් ඇති කරුණකි.
    5. සමාජයේ ආධ්‍යාත්මය පිළිබඳ කරුණකි. (.....)

02. දේශපාලන විද්‍යාව,
    1. ශාස්ත්‍රීය ලෙස හදාරන විෂයකි.
    2. එයට දීර්ඝ ඉතිහාසයක් ඇති විෂයකි.
    3. ඥාණ ගවේෂණ විද්‍යාවන් සමග සමීප විෂයකි.
    4. අතීතයේ ශාස්ත්‍රාලයන් තුළ අධ්‍යයනය කළ විෂයකි.
    5. වර්තමානයේද ශාස්ත්‍රාලයන් තුළ අධ්‍යයනය කරන විෂයකි. (.....)

03. දේශපාලනය කිරීමට ඇතුලත් වන්නේ,
    1. ආණ්ඩු බලය ලබා ගැනීමට ක්‍රියාත්මක වීම.
    2. මැතිවරණවලට සහභාගි වීම.
    3. දේශපාලන පක්ෂ ක්‍රියාකාරකම්වලට සහභාගි වීම.
    4. ආගමික ස්ථානවල අධ්‍යාත්මිකගැටුම් නිරාකරණය කිරීමට සහභාගි වීම.
    5. සටන් විරෝධතා ආදියට සහභාගි වීම. (.....)

04. දේශපාලනය හැදෑරීම.
    1. දේශපාලනය කිරීම හා සමපාත වේ.
    2. දේශපාලනයේ විවිධ පැතිකඩ ඇතුළත් වේ.
    3. ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඇතුළත් වේ.
    4. යුද්ධය හා සාමය ඇතුළත් වේ.
    5. අන්තර් ජාතික සම්බන්ධතා හා ගැටුම් ඇතුළත් වේ. (.....)

05. දේශපාලන මතවාද,
1. ලිබරල්වාදය 2. සමාජවාදය 3. චර්යාවාදය 4. පැසිස්ට්වාදය 5. සමූහාණ්ඩුවාදය (.....)

06. දේශපාලන ආයතන,
1. දේශපාලන සාහිත්‍යය 2. රාජ්‍යය 3. ආණ්ඩුව 4. දේශපාලන පක්ෂ 5. පළාත් ආණ්ඩු (.....)

07. දේශපාලන විද්‍යා විෂයේ ප්‍රධාන ධාරාවන් වන්නේ,
1. මිනිසා හා ඔහුගේ දේශපාලන විශ්වය අධ්‍යයනය කිරීම.
2. මානව ආචාර ධර්ම අධ්‍යයනය කිරීම.
3. යුද්ධය හා සාමය පිළිබඳ අධ්‍යයනය කිරීම.
4. බලය හා බල සම්බන්ධතා අධ්‍යයනය කිරීම.
5. දේශපාලන භාවිතයන් අධ්‍යයනය කිරීම. (.....)

08. දේශපාලන විද්‍යා අධ්‍යයන ප්‍රවේශ යනු,
1. දේශපාලනය හදාරන ආකෘතියකි.
2. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය විග්‍රහ කරන විධි ක්‍රමයකි.
3. දේශපාලන ප්‍රපංච හඳුනාගන්නා දෘෂ්ටිවේදයකි.
4. දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීමට යොදාගන්නා විග්‍රහ විදියකි.
5. රාජ්‍ය ගැන සකස් කළ න්‍යාය පද්ධතියකි. (.....)

09. ප්‍රතිමානීය අධ්‍යන ප්‍රවේශය,
1. වටිනාකම් පදනම් කරගෙන අධ්‍යනය කරයි.
2. මනෝමූලික මූලධර්ම මත අධ්‍යයනය කරයි.
3. යථාර්ථවාදයෙන් තොර අධ්‍යන ක්‍රමයකි.
4. කාල් මාක්ස් ද මේ ක්‍රමය භාවිත කළ අයෙකි.
5. ආචාර ධර්ම පදනම් කරගෙන අධ්‍යනය කරයි. (.....)

10. සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
1. දේශපාලනයට බලපාන සාමාජීය සාධක ඇසුරින් දේශපාලනය විග්‍රහ කරයි.
2. ඍජු නිරීක්ෂණ, සම්මුඛ සාකච්ඡා, ප්‍රශ්නාවලි යන උපක්‍රම යොදාගෙන විග්‍රහ කරයි.
3. සාම්ප්‍රදායික අධ්‍යන ප්‍රවේශයකි.
4. නූතන යුගයේදී බහුලව භාවිතා කරන ප්‍රවේශයකි.
5. කාල් මාක්ස්, මැක්ස් වෙබර් යන අය යොදාගත් ප්‍රවේශයකි. (.....)

11. දේශපාලන විද්‍යාවේ විෂය ක්ෂේත්‍රය,
1. සමාජීය විද්‍යා විෂය ක්ෂේත්‍රය මත පමණක් රඳා පවතී.
2. විෂය අධ්‍යයනයට යොදාගන්නා විෂය පථය වේ.
3. ගතික ස්වභාවයක් උසුලයි.
4. දේශපාලන දර්ශනය, මතවාද, න්‍යාය, ආයතන වලට පමණක් සීමා නොවේ.
5. කලින් කලට විවිධ යුගවල විවිධ විෂය ධාරාවන්ගෙන් සමන්විත වේ. (.....)

12. දේශපාලන දර්ශනය,
1. ඇරිස්ටෝටල් වැනි ග්‍රීක දාර්ශනිකයන් පමණක් නොව සමකාලීන දාර්ශනිකයන්ද යොදාගෙන ඇත.
2. සංකල්ප වල අර්ථ පැහැදිලි කරයි.
3. වර්තමානයේ ප්‍රතික්ෂේප වී ඇත.
4. විවිධ තර්ක ක්‍රම පදනම් කරගෙන ලෝකයේ විවිධ විෂයන් අවබෝධ කර ගනී.
5. දේශපාලන ක්‍රියාකාරිත්වයට මග පෙන්වන ප්‍රතිමානීය නිෂ්ටාවන් යෝජනා කරයි. (.....)

13. දේශපාලන පක්ෂ,
   1. ආණ්ඩු බලය ලබාගැනීම උදෙසා ක්‍රියාත්මක වේ.
   2. කේඩර හා ජනතාවාදී ලෙස ද වර්ග වේ.
   3. දීර්ඝ ඉතිහාසයකට හිමිකම් කියයි.
   4. මහජන මතයසංවිධානයකරයි.
   5. ප්‍රතිපත්තිමය හා මතවාදීමය අනන්‍යතාවයක් පවතියි. (.....)

14. ස්ත්‍රීවාදය,
   1. දේශපාලන ප්‍රවේශයක් මෙන්ම මතවාදයකි.
   2. ''ලිංගිකත්වය පූමතිරිකරණය කොට තිබේ'' යන්න මෙහි මූලික තේමාවයි.
   3. විවිධ ගුරුකුල වලින් යුක්ත වෙයි.
   4. රාජ්‍ය ගැන විශේෂ ස්ත්‍රීවාදී න්‍යායක් පවතී.
   5. පුරුෂාධිපති සමාජයක් ගොඩනැගීමට අනුබල නොදෙයි. (.....)

15. ආණ්ඩුව,
   1. වෙනස්වීම් වලට ලක්වන නම්‍ය ආයතනයකි.
   2. රාජ්‍ය වෙනුවෙන් පෙනී සිටින නියෝජිතයාය.
   3. රාජ්‍යයේ ගමන් දිසාව තීරණය කරයි.
   4. සැම අවස්ථාවකම ප්‍රජාතන්ත්‍රවාදී වේ.
   5. න්‍යායාත්මකව රාජ්‍යය ස්වාමියාවන අතර ආණ්ඩුව සේවකයා වේ. (.....)

- **අංක 16 සිට 25 දක්වා ප්‍රශ්නවලට ඒ ඒ ප්‍රශ්නයේ මාතෘකාවට අදාලව ප්‍රකාශ 5ක් ඇත. එම ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ ප්‍රකාශ 4ක් පමණි. නිවැරදි ප්‍රකාශ ඇතුළත් කාණ්ඩය තෝරන්න.**

16. රාජ්‍යය,
   A මිනිසුන් විසින් පිහිටුවාගෙන ඇති සමාජ සංවිධාන හා අනන්‍ය සම වේ.
   B එය ඓතිහාසික හා සමාජීය ප්‍රපංචයකි.
   C විවිධ ස්වරූප ගෙන ඇත.
   D ස්පර්ශ කළ නොහැකි අදෘශ්‍යමාන සංකල්පයකි.
   E අප සැම දෙනාගේම ජීවිතවලට ඍජුව හා වක්‍රව බලපාන සමාජ ආයතනයකි.
   1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

17. රාජ්‍යය උත්තරීතර වන්නේ,
   A ස්වාධිපති බලයේ හිමිකරුවා නිසාය.
   B සමාජයේ පොදු යහපත සලසන සමාගම වන නිසාය.
   C පුද්ගලයන්ට හා ආයතනවලට බලහත්කාරී බලය පාවිච්චි කළ හැකි නිසාය.
   D පුද්ගලයාගේ හා සමාජ සංවිධානවල පැවැත්මේ අවසාන තීරකයා වන නිසාය.
   E සමාජයේ සදාචාර මූලධර්ම මත පදනම් වූ ආයතනයක් නිසාය.
   1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

18 නූතන ජාතික රාජ්‍ය බිහිවීම,
   A ධනවාදයේ මෝරා යාම එයට බලපෑවේය.
   B ක්‍රිස්ත්‍රියානි ප්‍රොතෙස්තන්ත්‍ර ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය බලපෑවේය.
   C 'එක් ජාතියකට එක් රාජ්‍යයක්' යන සමීකරණය බලපෑවේය.
   D ග්‍රීක යුගයේ සිට දක්නට ලැබුණේය.
   E වර්තමානයේ ජාතික රාජ්‍ය යන සංකල්පය අලුතෙන් අර්ථකථනය කළයුතු බව කියවේ.
   1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

19. ග්‍රීක නාගරික (පෞර) රාජ්‍යය,

A දේශපාලනයේ ප්‍රථම සංවේතනික රාජ්‍ය ක්‍රමය වේ.

B කුඩා නගර කේන්ද්‍ර කරගෙන පාලනය විය.

C ක්‍රිස්තු පූර්ව යුගය තුළ පැවතුණි.

D විවිධ දේශපාලන මාදිලි දක්නට ලැබුණි.

E වැඩවසම් සමාජ ක්‍රමය මත පදනම් වීය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

20. සමාජවාදී රාජ්‍ය මාදිලිය,

A 20 සියවසේ බිහිවූ රාජ්‍ය මාදිලියකි.

B ව්‍යවසායකත්වය පිළිබඳ පෞද්ගලික අයිතිය.

C මධ්‍යගත සැලසුම් ආර්ථිකයක් සහිත පොදු දේපළ ක්‍රමය

D නිර්ධන පංතියේ ආඥාදායකත්වය සහිත කොමියුනිස්ට් පක්ෂය.

E රුසියාව, චීනය, කියුබාව, උතුරු කොරියාව යන රටවල්වල අත්හදා බැලිනි.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

21. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය,

A 'සීමිත රාජ්‍ය' පිළිබඳ සංකල්පය මෙහි මූලික හරය වේ.

B නීතියේ ආධිපත්‍යය ප්‍රමුඛ කරගත් සමාජ ක්‍රමයක් වේ.

C නියෝජන ආණ්ඩුක්‍රමය ප්‍රතික්ෂේප කරයි.

D තරඟකාරී වෙළඳපලක් සහිත ආර්ථික ක්‍රමයක් වේ.

E ධනවාදී ආර්ථික හා සමාජ ක්‍රමය මත පදනම් වේ.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.....)

- **පහත ප්‍රකාශ ඇසුරින් 22 හා 23 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

A රාජ්‍ය මර්ධනකාරී සංවිධානයකි.

B කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස් මෙහි පුරෝගාමියෝය.

C දේවවරම් වාදය බිඳවැටීමෙන් පසු බිහිවිය.

D මෙතෙක් රාජ්‍යයට දිව්‍යමය උපතක් තිබුනද මෙයට අනුව සමාජමය උපතක් ලැබුණි.

E මාක්ස්වාදය යනු ආර්ථික සාධකය මුල්කරගෙන බිහිවූ න්‍යායකි.

F හොබ්ස්, ලොක්, රූසෝ විසින් ඉදිරිපත් කර ඇත.

G මෙයට අනුව රාජ්‍යය සමාජ සම්මුතියක ප්‍රතිඵලයකි.

H රාජ්‍ය ඒ ඒ ඓතිහාසික යුගවලට අනුව විකාශනය වී ඇත.

22. සමාජ සම්මුතිවාදයට අදාල කාණ්ඩය තෝරන්න.

1. CDFG 2. ACDF 3. BCDE 4. CDEF 5. ACDH (.....)

23. මාක්ස්වාදයට අදාල කාණ්ඩය තෝරන්න.

1. ABDE 2. ABEH 3. ACDE 4. BDFH 5. ACFH (.....)

- **අංක 24 සිට 30 දක්වා ඇති ප්‍රශ්නවලට අදාලව ප්‍රකාශ 2ක බැගින් දී ඇත. ඒ ඒ ප්‍රශ්න අංකයට අදාලව දී ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත 1 වගුව සඳහා වන යොමුවෙහි සඳහන් 1, 2, 3, 4 හා 5 යන වරණවලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.**

| **අංකය** | **ප්‍රකාශ I** | **ප්‍රකාශ II** |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | **ප්‍රකාශය I** | **ප්‍රකාශය II** |
|---|---|---|
| 24 | ඒකීය ආණ්ඩු ක්‍රම ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය මධ්‍යගත කළ ආණ්ඩු ක්‍රමයකි. | වර්තමානයේදී බලය විමධ්‍යගත කරණයට යොමු වෙමින් පවතී. (.....) |
| 25 | සන්ධීය ආණ්ඩු ක්‍රම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන්ම බලය බෙදා හැර ඇති ආණ්ඩු ක්‍රමයකි. | මුල්වරට යොදාගත්තේ බ්‍රිතාන්‍ය ආණ්ඩුක්‍රමය තුළය. (.....) |
| 26 | පාර්ලිමේන්තු ආණ්ඩු වල විධායකය ඉවත් කරන්නේ දෝෂාභියෝගයක් මගිනි. | මෙම ආණ්ඩුවල විධායකය ඍජුවම ජනතා ඡන්දයෙන් තෝරා ගනී. (.....) |
| 27 | ජනාධිපති ආණ්ඩුවල විධායකය හා ව්‍යවස්ථාදායකය වෙන වෙනම තේරී පත්වේ. | ආදර්ශමත් ආණ්ඩුක්‍රමය ඇමරිකාවේය. එහි විධායකය වන ජනාධිපති ඡන්ද විද්‍යාලයකින්ද ව්‍යවස්ථාදායකය වෙනම ඡන්දයකින්ද තෝරාගනී. (.....) |
| 28 | දේශපාලන මතවාද දේශපාලන ක්‍රියාවලියට ආයතන වලට එහි ක්‍රියාකාරිත්වයට බලපෑමක් ඇති නොකරයි. | ලිබරල්වාදය, සමාජවාදය, සමූහාණ්ඩුවාදය, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය, පැසිස්ට්වාදය, නිරාගමිකවාදය දේශපාලන මතවාද වේ.(.....) |
| 29 | ජාතිකවාදය ජාතික රාජ්‍ය ගොඩනැගීමට කිසිදු දායකත්වයක් දක්වා නැත. | ජාතිකවාදය යනුවෙන් ක්‍රමානුකූලඒකාග්‍ර චින්තනයක් ඇත. (.....) |
| 30 | ගැටුම් යනු මිනිස්සු හා සමාජ කණ්ඩායම් නැතිනම් රටවල් 2ක් හෝ වැඩි ගණනක් අතර ඇති සම්බන්ධතාවයයි. | ගැටුමක් යනු තමන් අතර එකිනෙකට නොපැහෙන අරමුණු ඇති හෝ ඇතැයි සිතන පුද්ගලයන් හෝ සමාජ කණ්ඩායම් හෝ පාර්ශව කීපයක් අතර පවතින සම්බන්ධතාවයයි. (.....) |

## B කොටස

31. ''දේශපාන විද්‍යාව යනු දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීමයි'' මේ ප්‍රකාශනයේ වැදගත් තේමා2 කි. නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

32. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධය පැති 2 කි. නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

33. වර්තමාන ලෝකයේ දේශපාලනය, දේශපාලන සංසිද්ධි, රාජ්‍ය ප්‍රතිපත්ති හැඩ ගස්සවන මතවාද කීපයකි. 2ක් නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

34. පහත කෘති රචනා කරන ලද දේශපාලන චින්තකයෝ කවුද?
    (i) සමූහාණ්ඩුව - ..........................................................................................................
    (ii) දේශපාලනය - ..........................................................................................................

35. දේශපාලන විද්‍යා සාහිත්‍යයේ ''ආණ්ඩුව'' යන තේමාව බහුලව අධ්‍යයනය කර තිබේ. එවැනි ආණ්ඩු ගණනාවකි. 2ක් නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

36. සිවිල් සමාජය ප්‍රධාන අර්ථ කීපයකින් භාවිතා කරයි. එයින් දෙකක් ලියන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

37. සමකාලීන ලෝකයේ රාජ්‍යයේ කාර්යයන් ගණනාවකි. එයින් 2ක් ලියන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

38. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක නියෝජන ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමට අවශ්‍ය ලක්ෂණ ගණනාවකි. එයින් 2ක් ලියන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

39. ස්වාධිපත්‍යය යනු රාජ්‍ය සතු උත්තරීතර බලයයි. එය පැතිකඩ දෙකකි. නම් කරන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

40. ලිබරල්වාදය ප්‍රභේද 3ක් ඔස්සේ විකාශනය වී ඇත. එයින් 2ක් ලියන්න.
    (i) ..........................................................................................................................
    (ii) ..........................................................................................................................

41. සන්ධීය ආණ්ඩු පිහිටුවා ගැනීමට මුල් වූ හේතු 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

42. ඒකීය ආණ්ඩුක්‍රමයක දැකිය හැකි ලක්ෂණ ගණනාවකි. 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

43. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක විධායකයකොටස් 2කි. නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

44. ජනාධිපති ආණ්ඩුක්‍රමයක දැකිය හැකි ලක්‍ෂණ 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

45. පැසිස්ට්වාදී චින්තනයේ හා දේශපාලනයේ ප්‍රධාන ලක්ෂණ ගණනාවකි. 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

46. ජාතික වාදය මතවාදයක් මෙන්ම දේශපාලන ව්‍යාපාරයක්ද වේ. එහි ප්‍රධාන ස්වරූප 2කි. නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

47. ස්ත්‍රීවාදී ව්‍යාපාරයේත්, චින්තනයේත් ප්‍රධාන ධාරාවන් 5කි. එයින් 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

48. ගැටුම්වල කාර්යන් හඳුනා ගැනීමේදී ප්‍රධාන ප්‍රවේශ 2කි. නම් කරන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

49. ගැටුම් තුන්ආකාරයකට වර්ග කරයි. එයින් 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

50. ගැටුම්වල ජීවන චක්‍රය අවධි කීපයකින් යුක්ත වේ. එයින් 2ක් ලියන්න.

(i) ..........................................................................................................................

(ii) ..........................................................................................................................

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education NWP වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

23 | S | II

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019
## Second Term Test - Grade 12 - 2019

විභාග අංකය .............................

## දේශපාලන විද්‍යාව II

කාලය පැය තුනයි
(අමතර කියවීම් කාලය විනාඩි 10 යි.)

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් යුක්ත වේ.
- පළමුවැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද,
- දෙවැනි කොටසින් යටත් පිරිසෙයින් ප්‍රශ්න දෙකක්ද,
- තුන්වැනි කොටසින් යටත් පිරිසෙයින් එක් ප්‍රශ්නයක්ද වන සේ තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

### I කොටස

01. දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර සම්බන්ධතාවය හා වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. දේශපාලනය අධ්‍යයනය කිරීමට ඇති පහත ප්‍රවේශවලින් 2ක් විමසන්න.
(i) තුලනාත්මක ප්‍රවේශය (ii) චර්යාවාදී ප්‍රවේශය (iii) සමාජ විද්‍යාත්මක ප්‍රවේශය
(ලකුණු 10 x 2 = 20)

03. පහත මාතෘකා වලින් ඕනෑම දෙකක් සාකච්ඡා කරන්න.
(i) දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම (ii) දේශපාලන ආයතන
(iii) දේශපාලන මතවාද (iv) දේශපාලන න්‍යාය (10 x 2 = 20)

### II කොටස

04. රාජ්‍යයක් යනු කුමක්දැයි අර්ථ කථනය කොට නූතන භෞමික රාජ්‍යයක ලක්ෂණ හඳුන්වන්න.(ලකුණු 20)

05. පහත මාතෘකාවලින් ඕනෑම දෙකක් විස්තර කරන්න.
(i) ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය (ii) සමාජවාදී රාජ්‍යය
(iii) සමාජ සම්මුතිවාදය (iv) ස්ත්‍රීවාදය (10 x 2 = 20)

06. ඒකීය හා සන්ධීය ආණ්ඩු සසඳන්න. (ලකුණු 20)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් සාකච්ඡා කරන්න.
(i) පාර්ලිමේන්තු ආණ්ඩු (ii) ජනාධිපති ආණ්ඩු (iii) මිශ්‍ර ආණ්ඩු (10 x 2 = 20)

### III කොටස

08. ලිබරල්වාදය සමාජවාදයෙන් වෙනස්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 20)

09. පහත මාතෘකා වලින් ඕනෑම දෙකක් විමසන්න.
(i) සමූහාණ්ඩුවාදය (ii) ජාතිකවාදය (iii) නිරාගමිකවාදය (10 x 2 = 20)

10. පහත මාතෘකා වලින් ඕනෑම දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.
(i) ගැටුම් වර්ගීකරණය (ii) ගැටුම් සමථන ක්‍රියාවලිය
(iii) ගැටුම් සමථන මාධ්‍යය (iv) සාමය ගොඩනැගීම (10 x 2 = 20)

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019 - දේශපාලන විද්‍යාව

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | | | |
|---|---|---|---|---|---|
| (01) | - 5 | (11) | - 1 | (21) | - 4 |
| (02) | - 3 | (12) | - 3 | (22) | - 1 |
| (03) | - 4 | (13) | - 3 | (23) | - 2 |
| (04) | - 1 | (14) | - 4 | (24) | - 1 |
| (05) | - 3 | (15) | - 4 | (25) | - 2 |
| (06) | - 1 | (16) | - 2 | (26) | - 4 |
| (07) | - 2 | (17) | - 1 | (27) | - 5 |
| (08) | - 5 | (18) | - 5 | (28) | - 3 |
| (09) | - 5 | (19) | - 1 | (29) | - 4 |
| (10) | - 3 | (20) | - 3 | (30) | - 5 |

31. (i) දේශපාලනය (ii) දේශපාලන විද්‍යාව.
32. (i) දේශපාලනය කිරීම (ii) දේශපාලනය හැදෑරීම
33. (i) ලිබරල්වාදය (ප්‍රජාතන්ත්‍රවාදය, ජාතිකවාදය, ස්ත්‍රීවාදය ආදියෙන් ඕනෑම දෙකක්.)
(ii) සමාජවාදය
34. (i) ප්ලේටෝ (ii) ඇරිස්ටෝටල්
35. (i) ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුව, ප්‍රජාතන්ත්‍රවාදී නොවන ආණ්ඩුව
(ii) සන්ධීය ආණ්ඩු, ඒකීය ආණ්ඩු, සමාජවාදී ආණ්ඩු ආදී ඕනෑම දෙකක්.
36. (i) සම්භාව්‍ය ලිබරල්වාදී අර්ථය
(ii) සම්භාව්‍ය මාක්ස්වාදී අර්ථය, නව මාක්ස්වාදී ග්‍රාම්ෂියානු අර්ථය ආදී ඕනෑම දෙකක්.
37. (i) නීතියේ සමාජ පර්යායේ හා දේපවල භාරකාරත්වය
(ii) ආර්ථික පරිපාලනය හා මෙහෙයවීම, සමාජ පාලනය හා මෙහෙයවීම, නීතිය හා සාමය පවත්වාගෙන යාම, යුද්ධ ප්‍රකාශ කිරීම හා යුධ කිරීම ආදී ඕනෑම දෙකක්.
38. (i) නන්වැදෑරුම් නිදහස, සමානාත්මතාවය, ව්‍යවස්ථානුකූලවාදය
(ii) නීතියේ ආධිපත්‍යය, අධිකරණයේ ස්වාධීනත්වය වගකීම, නිදහස් හා සාධාරණ මැතිවරණ යන ඕනෑම දෙකක්.
39. (i) බාහිර ස්වාධිපත්‍යය (ii) අභ්‍යන්තර ස්වාධිපත්‍යය
40. (i) සම්භාව්‍ය ලිබරල්වාදය (ii) පශ්චාත් සම්භාව්‍ය ලිබරල්වාදය නව ලිබරල්වාදය - ඕනෑම දෙකක්
41. (i) භූමියේ විශාලත්වය (ii) සංස්කෘතික හා වාර්ගික විවිධත්වය
(iii) එක් රාජ්‍යයක් ලෙස ඒකරාශී වීමේ අවශ්‍යතාවය යන කරුණුවලින් ඕනෑම දෙකක්.
42. (i) ඒකීය ආණ්ඩුක්‍රමයක ඕනෑම (ii) ලක්ෂණ දෙකකට ලකුණු දෙන්න.
43. (i) නාමික විධායකය (ii) සත්‍ය විධායකය
44. (i) ජනාධිපති ආණ්ඩුක්‍රමයක (ii) ඕනෑම ලක්ෂණ දෙකකට ලකුණු දෙන්න.
45. (i) ඕනෑම ලක්ෂණ දෙකකට ලකුණු දෙන්න. (ii) රාජ්‍යවන්දනය, ඒක බලවාදය, නායක වන්දනය
46. (i) ජාතික රාජ්‍ය ජාතිකවාදය (ii) ජනවාර්ගික ජාතිකවාදය
47. (i) ලිබරල් ස්ත්‍රීවාදය, සමාජවාදී ස්ත්‍රීවාදය.
(ii) රැඩිකල් ස්ත්‍රීවාදය ආදී ඕනෑම කරුණු 2කට ලකුණු ලබාදෙන්න.
48. (i) ගැටුම්වල සාධනීය පැතිකඩ (ii) ගැටුම්වල නිෂේධනීය පැතිකඩ
49. (i) සරල වර්ගීකරණය
(ii) කෘත්‍යවාදී වර්ගීකරණය - දේශපාලන වර්ගීකරණය ඕනෑම කරුණු 2කට ලකුණු දෙන්න.
50. (i) ගැටුමකට පාදක වන කොන්දේසි
ගැටුම් පැන නැගීම, ගැටුම් උත්සන්නවීම, ගැටුමේ උත්සන්නතාවය අඩුවීම ආදිය ඕනෑම කරුණු දෙකකට ලකුණු දෙන්න.

## I කොටස

01. මෙම ප්‍රශ්නය පැති දෙකකින් විග්‍රහ විය යුතුය.
    (i) දේශපාලනය කිරීම. (ii)දේශපාලනය හැදෑරීම වශයෙනි.

02. (i) තුලනාත්මක ආසන ප්‍රවේශය හඳුන්වා එහි ලක්ෂණ, ප්‍රභේද යොදාගත් චින්තකයන් දැක්විය යුතුය.
    (ii) චර්යාවාදී ප්‍රවේශය හඳුන්වා, එහි ලක්ෂණ යොදාගත් අය වාසි/අවාසි දැක්විය යුතුය.
    (iii) සමාජ විද්‍යාත්මක ප්‍රවේශය හඳුන්වා යොදාගත් අය දැක්විය යුතුය.

03. (i) දේශපාලනය ශාස්ත්‍රීය ලෙස හැදෑරීම හඳුන්වා, එහි ප්‍රශ්න අර්ථ දෙක කෙටියෙන් ලියා එය අයත්පැතිකඩ 5 කෙටියෙන් දැක්විය යුතුය.
    (ii), (iii), (iv) ඒ ඒ මාතෘකා හඳුන්වා ඒවා දේශපාලන විද්‍යා අධ්‍යයනයේ විෂය ක්ෂේත්‍රය තුළ යොදාගන්නා ආකාරය දැක්විය යුතුය.

## II කොටස

04. රාජ්‍යය අර්ථකථනය කොට නූතන භෞමික රාජ්‍යයක ලක්ෂණ,
    (i) නිශ්චිත දේශසීමා (ii) ජාතික පදනම (iii)ආණ්ඩුව
    (iv) ස්වාධිපත්‍යය කෙටියෙන් විස්තර විය යුතුය.

05. (i), (ii), (iii), (iv) යන රාජ්‍ය ආකෘති හඳුන්වා ඒවායේ දක්නට ලැබෙන ලක්ෂණ කෙටියෙන් විස්තර විය යුතුය.
06. ඒකීය ආණ්ඩු හා සන්ධීය ආණ්ඩු හඳුන්වා ඒවායේ දැකිය හැකි ලක්ෂණ සන්සන්දනාත්මකව ලියා තිබිය යුතුය.

07. (i) , (ii), (iii) ඒ ඒ ආණ්ඩු හඳුන්වා ඒවායේ ලක්‍ෂණ හා වාසි අවාසි කෙටියෙන් දැක්විය යුතුය.

## III කොටස

08. ලිබරල් මතවාදය හා එහි ලක්ෂණත් සමාජවාදය මතවාදයත් එහි ලක්ෂත් එකිනෙක ලක්‍ෂණ වලින් වෙනස්වන අයුරු දක්වා තිබිය යුතුයි.

09. (i), (ii), (iii) මේ මතවාද කෙටියෙන් හඳුන්වා ඒවා දේශපාලනයට සිදු කළ කාර්යභාරය දැක්විය යුතුය.

10. (i), (ii), (iii), (iv) යන මතෘකාවලට අදාළ කරුණු ගැන කෙටි සටහන් ලිවීම අපේක්ෂා කරයි.